# සරල විහාරාරාම බිතුසිතුවම් කලාව හුදී ජනයාගේ ආගමික සුභාවබෝධය පිණිසයි

විල්ගමුවේ පියනන්ද හිමි[1]
අතලේ සුමන හිමි[2]

## හැඳින්වීම

සුන්දර ප්‍රීතිමත් කලාත්මක ආස්වාදය; කාමය, රාගය වර්ධනය නොවන පරිදි විතරාගී හැඟීමෙන් යුතුව ආස්වාදය කළ යුතු බවට බුදු දහම උපදෙස් දෙයි. බුදුදහමින් පෝෂණය ලද හෙළ කලාකරුවන් මෙම උපදේශය මනාව පිළිපදිමින් බුදු දහම ශ්‍රී ලාංකේය ජනතාව වෙත සමීප කිරීමේ මාධ්‍යයක් ලෙස අතීතයේ සිට චිත්‍ර කලාව භාවිත කොට තිබේ. බුදුදහම වැනි ගැඹුරු දහමක් විශාල දැනුමක් නොමැති පුද්ගලයන්ට අවබෝධ කර ගැනීම පහසු නොවේ. එවැනි අවස්ථාවක බුද්ධ චරිතය මෙන් ම බෝසත් චරිතය හා බෞද්ධ දර්ශනය මහජනයා වෙත නැඹුරු කරලීම සඳහා චිත්‍ර කලාව සන්නිවේදන මාධ්‍යක් ලෙසින් භාවිත කළ හැකිය.

## අරමුණු හා ක්‍රමවේදය

පුද්ගලානුබද්ධ දැනුම විවිධත්වයක් ගන්නා හෙයින් බුදුදහම හා සම්බන්ධ යම් යම් සිදුවීම් චිත්‍රානුසාරයෙන් ඉදිරිපත් කරලීම මානසික වශයෙන් මෙන් ම බුද්ධිමය වශයෙන් කිසියම් ප්‍රබෝධයක් ජනිත කරන්නකි. ඒ අනුව අතීත ශ්‍රී ලාංකේය චිත්‍ර කලා කරුවා බුද්ධ චරිතයේ මෙන්ම බෝසත් චරිතයේ එන වැදගත් සිදුවීම් සිතුවම් අනුසාරයෙන් පාඨක ජනයා වෙත සමීප කර තිබේ. එය නූතනය තුළ ද අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර චිත්‍ර කලාව පාඨක ජනයාට සමීප කිරීමෙන් විශාල ආගමික ප්‍රබෝධයක් ඇති කළ හැකි බව නොරහසකි. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලාංකේය ඓතිහාසික මූලාශ්‍රවල මෙන් ම චිත්‍ර කලාවේ ද දක්නට ලැබෙන කරුණු හා ලක්ෂණ සන්සන්දනාත්මක විමසුමකට ලක් කෙරේ. එතුළින් චිත්‍ර කලාවේ ඉතිහාසයත්, එහි උපයෝගීතාවයත් මැනවින් හඳුනාගත හැකිය. එම මූලාශ්‍රවල සඳහන් ආකාරයට මෙරට චිත්‍ර කලාව වර්තමානය දක්වා කුමන ආකාරයකින් විකාශනය වී තිබේ ද ? චිත්‍ර කලාව බුදුදහම නන්වාලීම සඳහා කුමන ආකාරයෙන් භාවිත කළ හැකි ද යන්න අධ්‍යයනය කිරීමත් වර්තමානයට හා අනාගතයට එහි ඇති උපයෝගිතාව කෙබඳු ද යන්න පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වේ.

---

1 උපශාලාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, wilpiyananda@gmail.com
2 උපශාලාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

**සාකච්ඡාව**

ආදිතම මිනිසා තම සිතුම් පැතුම් හා අභිප්‍රායන් මෙන්ම හැකියාවන් අනෙකෙකුට නිර්මාණාත්මකව ප්‍රදර්ශනය කිරීම සඳහා යොදාගන්නා ලද මාධ්‍ය වූයේ කලාවයි. එය නාට්‍ය, චිත්‍ර, සංගීතය, මූර්ති, නර්තන සහ සාහිත්‍ය යන බෙදීමෙන් යුක්තය. මෙහිදී අපගේ ප්‍රස්තුතයට අදාළ වන්නේ දෘෂ්‍ය කලාව හා සම්බන්ධ චිත්‍ර කලාවයි.

දෘෂ්‍ය කලාවන් අතර චිත්‍ර කලාවේ ඉතිහාසය මානව ඉතිහාසයේ ආරම්භය දක්වා ගමන් කරයි. එය දියුණු වෙමින් පරිනාමය වී ඇති ආකාරය ශ්‍රී ලාංකේය හා බටහිර චිත්‍ර කලා ඉතිහාසය පිළිබඳ පිරික්සීමෙන් මනාව තහවුරු වේ. ශ්‍රී ලාංකේය චිත්‍ර කලාවේ ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන බවට ඓතිහාසික මූලාශ්‍ර සාක්ෂි දරයි. දැනට ශේෂව ඇති දෘෂ්‍යමාන සාක්ෂි අනුව මෙම දෘෂ්‍ය මාධ්‍ය කලාව විවිධ පැතිකඩ මගින්; එනම් බිතු සිතුවම් කලාව, පෙතිකඩ චිත්‍ර, මැටිබඳුන් පින්තාරුව, පුස්කොළ පොත් හා ඒවායෙහි කම්බා අලංකරණය, වෙස්මුහුණු වර්ණාලේපය තුළින් පුරාතන ශ්‍රී ලාංකේය ජනතාවගේ ජන විඥානයත් ඔවුන්ගේ සිතැඟියාවන් සන්නිවේදනය කිරීමේ මාධ්‍ය ලෙසත් පුළුල්ව භාවිත කොට ඇත.

මහින්දාගමනයෙන් පසු හෙළ කලාකරුවා සාධු ජන සමාජයක් බිහිකිරීම උදෙසා හුදෙක් චිත්‍ර කලාව තුළින් විහාරාරාම හා ගොඩනැගිලි අලංකාර කිරීම පමණකින්ම නොනැවතී බුද්දහම ප්‍රචාරය කිරීමේ සන්නිවේදන මාධ්‍යයක් ලෙස තම සිතුවම් කරණය භාවිත කොට ඇත. එසේ භාවිත කළ බවට තොරතුරු වංසකථා හා පසුකාලීන සන්දේශ කාව්‍යයන්හි මෙන්ම ෆාහියන් හිමියන්ගේ වාර්තාවෙහි ද සඳහන්ව තිබේ.

එම සාහිත්‍ය මූලාශ්‍රවලට අනුව මහාවංසයේ සඳහන් දළදා උත්සවය පිළිබඳව ෆාහියන් හිමියන් විසින් ද වාර්තා කර තිබේ. සමකාලී වාර්තා තැබීමක් හෙයින් ෆාහියන් තෙරුන්ගේ සටහන් වැදගත්කමින් අනූන වෙයි. උන්වහන්සේගේ සටහනට අනුව දළදා පෙරහැර පිළිබඳව රජුගේ අණ බෙරයෙන් පසු ."මෙම නියෝගය දැන් වූ ඉක්බිති රජතුමා බෝධි සත්ත්වයන් වහන්සේගේ පූර්ව චරිතය දක්වන පන්සිය පණසක් ජාතක කථා සිතියම් චිත්‍ර වස්ත්‍ර වීථිය දෙපස (එල්වා) තබයි. එක තැනක සුදාන (වෙස්සන්තර) ජාතකය ද තව තැනක සාමජාතකය ද කිසි තැනක බෝසතාණන් හස්තීන්ගේ රජ වූ නියාව ද, අන්‍ය තැනක මුව රජ හෝ අශ්ව රජ වූ නියාව යුත් ජාතක සිතුවම් කොට පෙන්වනු ලැබේ. ...... " මෙම සඳහනට අනුව තත් අවධියේ (ක්‍රි. ව. පස්වන සියවස) දළදා පෙරහැර පවත්වන මාර්ගය දෙපස ජාතක කථාවන් සිතුවමින් අලංකාර කොට ඇත. එය හුදී ජනයා තුළ ශ්‍රද්ධාව ජනිත කරවීමට රාජ්‍ය අනුග්‍රහය ඇතිව කරන ලද්දකි.

ශ්‍රී ලාංකේය සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ ලියවුණු සංදේශ ආදී සියලුම ග්‍රන්ථයන්හි තත් අවධියේ පැවති විහාරාරාම සිතුවම් කලාවේ අසිරිය මැනිවින් දක්වා ඇත. ඒ බවට ගිරා සංදේශයෙහි මෙම කවිය හොඳම නිදසුනයි.

''මනරම් වෙහෙර තුළ තැන තැන සපැමිණිය
සිතියම් බණ වසුන් විදහා අපමණය
සිතු සොන්නසින් සිහි කර කර බුදුගුණය
අබිදම් පෙළ අරුත් විමසන සඟ ගණය ''

හෙළ චිත්‍ර කලා කරුවා ස්වකීය හැකියාවෙන් ලාංකේය ජනසමාජය සදාචාරාත්මක ජන සමාජයක් ඇති කිරීම උදෙසා තම තෙලිතුඩ මෙහෙයවා ඇති බව ඒ ඒ අවධීන්හි රචිත සාහිත්‍ය ග්‍රන්ථයන් පිරික්සීමෙන් මොනවට පැහැදිලි වේ. එසේම දෘෂ්‍ය තොරතුරු අනුව ද තත් විෂයෙහි උගතුන් ලාංකේය සිතුවම් කලාව පහත ආකාරයට වර්ග කොට ඇත.

01. ක්‍රි.ව. පස්වැනි හා දොළොස්වැනි සියවස් අතර කාල පරිච්ඡේදයේ සිතුවම් සම්ප්‍රදාය
    සීගිරිය, හිඳගල, දිඹුලාගල, මිහින්තලය, මහියංගනය, තිවංක පිළිම ගෙය, ගල්විහාරය, හා දිඹුලාගල මාරවීදිය වැනි ස්ථාන
02. ක්‍රි.ව. දහතුන්වැනි හා දාහත්වැනි සියවස් අතර කාල පරිච්ඡේදයේ පැවති චිත්‍ර කලා සම්ප්‍රදාය
    ගඩලාදෙනි විහාරය
03. ක්‍රි.ව. දහඅටවැනි හා දහනවවැනි සියවස්වලට අයත් බිතුසිතුවම් සම්ප්‍රදාය (මහනුවර රාජධානි සමයේ සිතුවම් කලාව)
    ගංගාරාමය, දෙගල්දොරුව, මැඳවල, සූරියගොඩ, රිදී විහාරය හා තවත් බොහෝ තැන්

ප්‍රතිමාවක් හෝ කිහිපයක් නිර්මාණය කිරීම සඳහා ඉදිකරන ලද මෙම විහාරගෙවල්හි ඇතුලත හා පිටත බිත්ති පෘෂ්ටයන්හි හා වහලයට යොදන ලද සිවිලිම ද චිත්‍ර සඳහා යොදාගෙන ඇත. බුදුදහම පිළිබඳ දැනුමැති අයගේ අනුශාසනාවන් මත සිතුවම් කරන ලද එම විහාරාමයන්හි සමාන්‍ය ජනතාවට වැටහෙන අන්දමින් බුද්ධචරිතය හා බෝසත් චරිතයන් චිත්‍රයට නගා ඇත්තේ බුදු දහම කියාදෙන සරල බණ පොතක් ලෙසය.

බඹරගල, හඟුරන්කෙත, අරත්තන, ලංකාතිලකය ආදි ස්ථානවල සූවිසි විවරණය හා වෙස්සන්තර වැනි ජාතක කථා සිතුවම් කර තිබීමෙන් ද එම චිත්‍ර සමගම මාතෘකා පාඨ ද දැක්වීමෙන් ද බුද්ධත්වය ලැබීමෙහි අති දීර්ඝ සංසාර ගමනත් බුදුන් වහන්සේගේ දුෂ්කර වූ බෝධිසත්ව චරිතයත් සරල ආකාරයෙන් චිත්‍රයට නගා ඇත. එහි අභිප්‍රාය වනුයේ දස පාරමිතාවන් පූරණය සඳහා ජනයා උනන්දු කරවීමයි. දඹුල්ල, කැලණිය ආදී බොහෝ විහාරයන්හි සිවිලිමේ චිත්‍රයට

නගා ඇති දෙව් බඹුන් බුදුන්වහන්සේට නමස්කාර කරන විලාසය දැක්වීමෙන් බුදුන් වහන්සේගේ පිවිතුරු බව හා දේවාති දේව බව ද, නෙලුම් මලෙන් නිර්වාණය ද දක්වා ඇත. රිදීවිහාරය, හිඳගල ආදී විහාරයන්හි සිතුවම් කොට ඇති අටමස්ථාන සොළොස්මස්ථාන වැනි චිත්‍රවලින් ලාංකේය බෞද්ධ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබාදී ඇත. එසේම පුරාණයේ සිට පොදු ජනයා බුදුන් වැඩීමේ දී එම ස්ථාන වන්දනා කිරීම සිදුකරයි. එහිදී එම ස්ථාන පිළිබඳ චිත්තරූප මවාගනිමින් වැදපුදා ගැනීමට මෙමගින් අවස්ථාව සලසා ඇත.

අතීත කලාකරුවා අකුසලයෙහි හා පාපයෙහි ආදීනව නරකාදිය නිර්මාණය කිරීමෙන් ද කුසලයෙහි හා පුණ්‍යකර්මයන්හි නියලීමේ වැදගත්කම සදිව්‍යලෝකයන් චිත්‍රයට නැගීමෙන් ද මනාව ප්‍රදර්ශනය කොට ඇති බව හඟුරන්කෙත වැනි විහාර සිතුවම්වලින් පැහැදිලි වේ. මෙවැනි සිතුවම් මගින් තත් ජන සමාජය සුමඟට යොමු කිරීම සිදු කොට ඇත. සමස්තයක් ලෙස ගත් විට ලාංකේය විහාරාරාම සිතුවම් කලාව සාමාන්‍ය ජනයාට දැකීමෙන් අවබෝධ වන ලෙසට සංකීර්ණත්වයෙන් බැහැරව සරල වර්ණ සංයෝජන හා සංකලනයෙන් එදිනෙදා ජීවිතයට උපමා සැපයෙන ජාතක කථා, හතළිස් පස්වරක බුද්ධ චරිතයේ විවධ සිදුවීම් හා බුදුන්වහන්සේගේ ලෝ සසුන් සේවය ආදි තේමාවන් මූලික කොට කරන ලද සිතුවම් වලින් ලාංකේය ජන සමාජය දස අකුසලෙන් මුදා දස පුණ්‍යක්‍රියාවන්හි නිරත කරවීම සඳහා නිසි මාර්ගෝපදේශය ලබා දී ඇත.

නූතනයෙහි පවත්නා දියුණුවත් සමඟ ලාංකේය විහාරාරාම සිතුවම් කලාව මෙයට වඩා දියුණු වී ඇති අතර බුදුදහම සන්නිවේදනය කිරීම පමණක් වන අරමුණින් බැහැරව ඇති බව දිනෙන් දින දැක ගත හැකි සුළඹ සිදුවීමකි. චීන දේශාටක ෆාහියන් හිමියන් විසින් කරන ලද වාර්තා සඳහනෙහි දක්නට ලැබෙන දළදා පෙරහැර නූතනයේ ද එසේම පවත්වයි. මාර්ග දෙපස ද ජාතක කථා නව තාක්ෂණය උපයෝගි කරගෙන සිතුවම් කොට එල්ලා තිබේ. එදා සහ අද දක්නට ලැබෙන වෙනස වනුයේ මේ ජාතක කථා නූතනයේ විවිධ දෙපාර්තමේන්තු, සංස්ථා, බැංකු ආදි ආයතන මගින් නිමවා තිබීමයි. ජාතක කථාව ඇඳි සිතුවමේ යට ප්‍රදේශයේ එය සිතුවම් කළ ආයතනයේ නම සඳහන් කර ඇති අතර එයින් ඔවුන් සිය ආයතනයේ වෙළඳ දැන්වීමක් ප්‍රචාරය කිරීමට උත්සාහ ගෙන තිබේ. එය ශ්‍රද්ධාව අබිබවා වෙළඳාම ඉදිරියට ඒමේ ප්‍රවණතාවකි. බෞද්ධ කොඩියට හා ධර්ම චක්‍ර මුද්‍රාවට සිදු වී ඇත්තේ ද මෙවැනිම තත්ත්වයකි. එසේම නූතනයෙහි බොහෝ විහාරාරාමයන්හි සිතුවම් කරන ලද සිතුවම් තුළින් ද අලංකාරය පමණක්ම අපේක්ෂා කිරීම නිසා එම සිතුවම් සංකීර්ණත්වට පත්ව ඇත. එනිසාම එම සිතුවම් බොහෝ විට ධර්ම සන්නිවේදනයෙන් තරමක් බැහැරව ඇත. එසේනම් නූතන ලාංකේය විහාරාරාම සිතුවම් කලාව කෙසේ විය යුතු ද? යන පැනයට අපට දෙන නිදසුන වනුයේ අතීතයෙහි ලාංකේය විහාරාරාම සිතුවම් කලාවයි.

## නිගමනය

නූතන සන්නිවේදනයේ දී මෙන්ම ඉගැන්වීම් ක්‍රම ශිල්පයන්හි භාවිත විද්‍යාත්මක දෘෂ්‍යාධාර ක්‍රමය අතීතයෙහි සිට මානවයා තම සිතැගියාවන් හා දර්ශනයන් තව එකෙකු වෙත පහසුවෙන් සන්නිවේදනය කිරීම සඳහා චිත්‍ර කලාව භාවිත කොට ඇත. ශ්‍රී ලංකාවට බුදුදහම ලැබීමෙන් පසු මෙරට සිටි සිත්තරුන් තම හැකියාවෙන් බුදුදහම සාමාන්‍ය ජනයාට සරලව තේරුම් කරදීමට විහාරාරාමයන්හි බුද්ධචරිතය හා සම්බන්ධ සිදුවීම් ද, බොධිසත්ව චරිතය කියවෙන පන්සිය පනස් ජාතක පොත් වහන්සේ තුළ ඇති තෝරාගත් ජාතක කථා ද, බුදු දහමේ කියවෙන නිරය, සදෙව්‍ය ලෝක, නිර්වාණය වැනි සංකල්ප පිළිබඳ පැය ගණනාවක දේශනාවකින් පැහැදිලි කළ යුතු ධර්ම කරුණු හා බෝසත් චරිත කථා මෙන්ම බුදුසිරිතෙහි අසිරිමත් සිදුවීම් පිළිබඳ සිද්ධීන් ද සිතුවමින් කරන ලද කුඩාරාමුවකින් පැහැදිලි කිරීමට සමත්ව ඇත. එමගින් කියවා අසා දැනගත් අවබෝධය එම සිතුවම් නැරඹීමෙන් වඩාත් ප්‍රබල විය. මේ අනුව සංකීර්ණත්වයෙන් තොරව සරලව සිදුකරන විහාරාරාම චිත්‍ර කාලාව බුදුදහම පිළිබඳව පොතපත කියවා අසා තේරුම් ගැනීමට හැකි, නොහැකි පිරිසට බුදු දහම පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම සඳහා මෙන්ම එම අවබෝධකරගත් දහම ප්‍රත්‍යක්ෂ කර ගැනිම සඳහා මනා පිටුවහලක් වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

*ඌනපූරණසහිතො මහාවංසො.* (1959). (සංස්.). පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*ෆාහියන්ගේ බෞද්ධරාජධානි සහ වන්දනා ගමන් විස්තරය.* (2010). (පරි.) ඩබ්ලිව්. චාර්ලිස් ද සිල්වා, බත්තරමුල්ල: ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

*ගිරා සන්දේශ විවරණය* (2002). (සංස්.) කුමාරතුංග මුනිදාස. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.